පොදු චක්‍රලේඛ අංක 02-93/2014.

මගේ අංක FHB/AH/LET/2014

සෞඛ්‍ය අමාත්‍යාංශය,

"සුවසිරිපාය"

නො 385,

පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10.

2014-06-19

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු,

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,

සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,

සියලුම අධ්‍යක්ෂවරු/සෞඛ්‍ය ආයතනභාර නිලධාරීන්,

සියලුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්ෂවරු,

ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ,

සියලුම මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ,කොළඹ මහනගර සභාව,

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ "යොවුන් සෞඛ්‍ය" පිළිබඳ වගකීම දරන ආයතනය.</u>**

වයස අවුරුදු 10-19 ත් දක්වා වයස පරාසය "නව යෞවනය" ලෙස සලකන අතර, වයස අවුරුදු 15- 24 අතර කාලය"තරුණවිය"ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ ජනගහණ ඇස්තමේන්තු අනුව "නව යෞවනයන්" මිලියන 3.7 ක් වන අතර මිලියන 3.2 ක් "තරුණ"ජනගහනය වේ. මෙම කණ්ඩායම් ශ්‍රී ලංකාවේ අනාගතයට, ආර්ථිකයට හා සංවර්ධනයට බලපාන වැදගත් කණ්ඩායම් වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විවිධ අංශ මගින් යෞවනයන් සහ තරුණයන්ගේ සෞඛ්‍ය නැංවීම සඳහා නොයෙක් වැඩසටහන් පවත්වාගෙන යයි. මෙම තත්ත්වය නිසා යෞවනයන් සඳහා වැඩසටහන් නිවැරදිව සම්බන්ධීකරණය කිරීමේ අපහසුතාවයත් සම්පත් කාර්යක්ෂමව භාවිතාකිරීමේ ගැටළු හා අපතේ යාමත්, සෞඛ්‍ය හා අනෙකුත් අදාල අංශ සමග සම්බන්ධීකරණයේදී ව්‍යාකූල තත්ත්වයට පත්වීම සිදුව ඇත. එම නිසා සියළුම නව යොවුන් හා තරුණ සෞඛ්‍ය වැඩසටහන් මනා ලෙස සංවිධානය කර පවත්වාගෙන යාමේ වගකීම දැරිය හැකි ජාතික මට්ටමේ එක් කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් හඳුනා ගැනීමට අවශ්‍යව ඇත. තවද නවයොවුන් සෞඛ්‍ය හා යොවුන් සෞඛ්‍ය සේවාවන් ඒකාබද්ධකර පවත්වාගෙන යාමට සෞඛ්‍ය අමාත්‍යාංශය තිරණය කර තිබේ.

පවුල් සෞඛ්‍ය කාර්යාංශය, මාතෘ හා ළමා (අවු 0 -18 දක්වා) සෞඛ්‍ය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික කේන්ද්‍රීය ස්ථානය ලෙස කටයුතු කරන අතර, 1990 සිට නව යොවුන් කණ්ඩායම් උදෙසා විවිධ සෞඛ්‍ය වැඩසටහන් දියත්කර ඇති අතර, නවයොවුන් සෞඛ්‍ය වැඩසටහන ආරම්භ කිරීමේලා මූලිකත්වය ගෙන ක්‍රියාකරන ලදි.

ඉහත කරුණු සැලකිමේදි පවුල් සෞඛ්‍ය කාර්යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශය තුල නවයොවුන් හා තරුණ සෞඛ්‍ය වැඩසටහන් වල කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස විය යුතු බව සෞඛ්‍ය අමාත්‍යාංශය තිරණය කර ඇත.

මෙම නව වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු වස් දැනට පවත්නා වැඩසටහන් පුළුල් කර මේ දක්වා එමගින් ආවරණය වු පාසල් යන සහ පාසල් නොයන නව යොවුන් කණ්ඩායම් වලට අමතරව අවුරුදු 24 දක්වාවු තරුණ කණ්ඩායම්ද ඇතුලත් වන පරිදි වැඩසටහන් දියත් කෙරෙනු ඇත. ඒ මගින් ජිවන චක්‍රයේ විවිධ වයස් පරාස හරහා සෞඛ්‍ය නැංවීමේ නොයෙක් වැඩසටහන් මනා සම්බන්ධිකරණයකින් යුතුව හා කාර්යක්ෂම ලෙස සිදු කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. මෙම පුළුල් කිරීමට අනුව පවුල් සෞඛ්‍ය වැඩසටහනේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශද නැවත සකස් කරනු ඇත. නව යොවුන් හා තරුණ කණ්ඩායම් සඳහා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සපයන මහඟු කර්තව්‍යයේදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනෙකුත් අදාල අංශ පාර්ශවකරුවන් ලෙස සලකනු ඇත.

සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,

සෞඛ්‍ය අමාත්‍යාංශය

පිටපත්

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් ,යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

අතිරේක ලේකම්, වෛද්‍ය සේවා,සෞඛ්‍ය අමාත්‍යාංශය

සභාපති, ජාතික තරුණ සේවා සභාව

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, මහජන සෞඛ්‍ය I & II සෞඛ්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ, සෞඛ්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, රසායනාගාර සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ, සෞඛ්‍ය සහ පෝෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂ, තරුණ සංවර්ධන, යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා නියෝජිත, ලෝක සෞඛ්‍ය සංවිධානය/එක්සත් ජාතින්ගේ ජනගහණ අරමුදල/එක්සත් ජාතින්ගේ ළමා අරමුදල/ලෝක බැංකුව/ලෝක ආහාර වැඩසටහන